**ශීර්ෂය 147 - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය**

---

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම,චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

ආ) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් නියමිත දිනයට පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267 / 2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් , එය මාස 01 ක ප්‍රමාදයකින් පසු 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2019 අප්‍රේල් මස 01 දින විගණනයට ඉදිරිපත් කර ඇත. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් නොවන ලැබීම් ලෙස භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් ලෙස රු.271,130,853 ක් දක්වා තිබුණද විගණනට ඉදිරිපත් කරන ලද ලිපිලේඛන හා මාසික ගිණුම් සාරාංශය අනුව එය රු.268,310,000 ක් වී තිබුණි. ඒ අනුව රු.2,820,853 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම්ගත කළ යුතු වීම. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා ඇති අග්‍රිම ලැබීම් පිළිබඳ තොරතුරු ACA 3 ආකෘතිය අනුව භාණ්ඩාගාරයෙන් සෘජු ලැබීම් රු.268,310,000 ක් විය. අදාල වර්ෂය තුල විවිධ මූල්‍ය ප්‍රභවයන්ගෙන් අමාත්‍යාංශය විසින් එකතු කරගත් මුදල රු.2,820,853 ක් පමණ වේ. එම එකතු කරගත් මුදලද අග්‍රිමයේ කොටසක් ලෙස සලකනු ලැබේ. එබැවින් එම සියළු ලැබීම් එකතු කර අග්‍රිම ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ වෙනත් ලැබීම් ලෙස රු.1,907,853 ක් දක්වා තිබුණද, විගණනයට ඉදිරිපත් කරන ලද මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.4,615,288 ක් වී තිබුණි. ඒ අනුව රු.2,707,435 ක වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍යකාර්ය සාධන ප්‍රකාශනයෙහි භාණ්ඩාගාර අග්‍රිම යටතේ රු.271,130,853 ක් ලෙස සටහන් කර ඇත. එය සකස් වී ඇති ආකාරය ACA-3 ඇමුණුම මගින් දක්වා ඇත. එම ඇමුණුමෙහි ආකෘතිය අදාල චක්‍රලේඛයේ සඳහන් පරිදි ඉදිරිපත් කර ඇත. එහි අග්‍රිම ලැබීම් භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් හා වෙනත් මූලාශවලින් ලැබෙන මුදල් සහ එම දෙකෙහි එකතුවලෙස දැක්විය යුතුය. ඒ අනුව භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.268,310,000 හා වෙනත් මූලාශ්‍රවලින් ලැබුණු රු.2,820,853 ක මුදල එකතු කර රු.271,130,153 ක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි වෙනත් ලැබීම් යටතේ දක්වා ඇත. |
| (ඇ) ඉහත (ආ) ඡේදය ප්‍රකාරව වූ විගණන නිරීක්ෂණය හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.113,418 කින් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යය සාධන වාර්තාවේ දක්වා ඇති අග්‍රිම ශේෂය රු.485,298,744 නිවැරදි බව කාරුණිකව සඳහන් කරමි. මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 54 හි දක්වා ඇති අක් මුදල් ගැලපුම් ගිණුම මගින් මෙම අග්‍රිම ශේෂය සකස් වී ඇති ආකාරය තහවුරු කර ඇත. විගණනය විසින් දක්වා ඇති ශේෂය සකස් වී ඇති ආකාරය හඳුනා ගත නොහැක. |

### 1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ලෙස දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.92,287,698 ලෙස දක්වා තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත පිටපත් අනුව එය ශුන්‍ය අගයක් වී තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.1 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශයන්හි සංඛ්‍යාමය අගයන් භාණ්ඩාගාර මුද්‍රිතයෙහි වටිනාකම් සමඟ එකඟවිය යුතු වීම. | විගණන නිරීක්ෂණය පිළි ගෙන ඇත. CIGAS වැඩසටහන හරහා වත්කම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීමේදී සිදුව තිබූ දෝෂයන් නිවැරදි කිරීම සඳහා කටයුතු කිරීම හේතුවෙන් භාණ්ඩාගාර සටහන් අනුව දේපල පිරියත හා උපකරණ වටිනාකම ශුන්‍ය අගයක් වී ඇත. දැනට එම තොරතුරු යාවත්කාලීන කරමින් සිටින බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 වර්ෂයේදී කුලී පදනම මත ලබා ගෙන තිබුණු කාර්යාල ගොඩනැගිල්ල වෙනුවෙන් බාහිර පාර්ශවය වෙත ලබා දුන් අත්තිකාරම් හා තැන්පතුවල වටිනාකම වූ රු.312,156,151 ක් කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ දක්වා නොතිබුණි. | 2016 වර්ෂයේ අගෝස්තු 03 දින රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 250/2016 (i) ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | අංක 250/2016(1) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ 2016 අගෝස්තු 03 දින වන අතර, බාහිර පාර්ශවයන් සඳහන් අත්තිකාරම් මුදල් ගෙවීම ගිණුම්ගත කිරීම පිළිබඳව එමඟින් උපදෙස් ලබාදී ඇත. මෙම අමාත්‍යාංශයට අදාල විගණන විමසුම පරිදි වන ගොඩනැගිලි කුලී වෙනුවෙන් අත්තිකාරම් හා තැන්පත් මුදල් ගෙවාඇත්තේ එම චක්‍රලේඛය නිකුත් කිරීමට පෙරය. එබැවින් චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කිරීමට නොහැකි වී ඇත.<br>මේ පිළිබඳව භාණ්ඩාගාර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් විමසීමේදී අදාල චක්‍රලේඛය මුදල් ගෙවූ දිනට පසුදාතමින් නිකුත් කර ඇති බැවින් මෙම අත්තිකාරම් මුදල ගෙවීමට අදාලව චක්‍රලේඛ උපදෙස් අදාල නොවන බවට දන්වන ලදී. |

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ආදායම් නොවන ලැබීම් ලෙස රු.270,992,728 ක් දක්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.272,925,287 ක් වී තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ උපදෙස් පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | හරස් සටහන් ලැබීම් අත්හැර මුදල් ප්‍රවාහය පමණක් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශ වාර්තාවට මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කර ඇත. විගණනය විසින් හරස් සටහන් ලැබීම්ද සැළකිල්ලට ගෙන මුදල් ප්‍රවාහය හඳුනාගෙන ඇත. |
| ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් ලෙස රු.215,008,263 ක් දක්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.219,105,272 ක් වී තිබුණි. | -එම- | හරස් සටහන් ගෙවීම් නොසලකා මුදල් ප්‍රවාහය තුළ පුද්ගල පඩි නඩි වියදම ඇතුළත් කර ඇත. විගණනය විසින් හරස් සටහන් ගෙවීම්ද සැළකිල්ලට ගෙන මුදල් ප්‍රවාහය හඳුනාගෙන ඇත. |

| | | |
|---|---|---|
| ඇ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුල රු.398,727 ක් තැන්පතු ලැබීම් හා ගෙවීම් ලෙස දක්වා නොතිබුණි. | - එම - | පොදු තැන්පත් ගිණුමේ ලැබීම් ලෙස සටහන් කර ඇති මුළු මුදලම එම වර්ෂය තුළදී ගෙවීම් කර ඇත. මෙම කොටස මූල්‍ය කාර්යසාධන වාර්තාවේ වාර්තා කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පත් ගිණුමෙහි වෙනස්වීම් පමණක් වාර්තා කළ යුතුව ඇත. |
| ඇ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ලෙස ගෙවා තිබුණු රු.4,930,945 ක් හා ණය ආපසු ලැබීම් වටිනාකම වූ රු.3,119,473 ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ දක්වා නොතිබුණි. | - එම - | අත්තිකාරම් ගෙවීම සඳහා ලැබුණු මුදල්ද විමසුමෙහි I හි සඳහන් ආදායම් නොවන ලැබීම් තුළ ඇතුළත්ව ඇත. අත්තිකාරම් ගිණුමේ ලැබීම්ද හරස් සටහන් මගින් වන ලැබීමක් හෙයින් එයද ඇතුළත් කර නොමැත. |

### 1.6.5 අත්තිකාරම් ගිණුම් ශේෂ

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අ) 2016 අප්‍රේල් 07 දින විභාග දෙපාර්තමේන්තුව සිට ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයට ස්ථාන මාරු වී පැමිණි කාර්යාල කාර්යය සහයකවරයා 2017 ජුනි 22 දින සිට සේවයට වාර්තා කර නොතිබුණත් ඔහුට 2017 ජූලි මස වැටුප ලෙස රු.33,719ක් ගෙවා තිබුණි. එම වැටුප සමාලෝචිත වර්ෂය තුලදී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවිධිමත් ගෙවීම් අවම කර ගැනීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කර මෙවැනි ගෙවීම්වලට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විධිමත් පියවර ගත යුතු වීම. | ගෙවා ඇති මුලු වැටුප ආපසු ගෙවන ලෙසට දැන්වීමට කටයුතු කර ඇත. |
| ආ) ඉහත සඳහන් කාර්යාල කාර්ය සහයකවරයා සේවය හැර ගොස් 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 ½ අධික කාලයක් ගත වී ඇතත්, ඔහුගෙන් අයවිය යුතු රු.85,895 ක ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අවස්ථා කිහිපයකදී ණය මුදල ආපසු ගෙවන ලෙස දන්වා ඇත. ප්‍රතිචාර දක්වා නොමැති හෙයින් නඩු පැවරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**1.6.6 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම**<br>**රු.** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 (3) හා 104 (4) | අලාභය තක්සේරු කර නොමැත. | ප්‍රාරම්භක වාර්තාව දින 07 ඇතුලත හා වාහනයකට අනතුරක් සිදු වූ පසු ඒ පිළිබඳව මාස 03 ක් ඇතුළත පූර්ව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, අනතුර සිදු වී දින 185 ක් ඉක්මවා තිබුණද එවැනි වාර්තා හෝ සිදුවූ අලාභයට වගකිව යුතු නිළධාරීන් හඳුනා ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව හා පූර්ණ වාර්තාවන් නියමිත දින ඉදිරිපත් කළ යුතුය. | WP CAQ- 2508 දරන රථය ගරු අමාත්‍ය තුමාගේ උපදේශක ලෙස කටයුතු කළ නිලධාරියා විසින් පරිහරණය කළ රථය වන අතර 2018 ඔක්තෝබර් 26 දින අමාත්‍යාංශ සංශෝධනයත් සමඟ නැවත එම රථය අමාත්‍යාංශයට භාරදෙන අවස්ථාවේදී අලාභයක් සිදුවී ඇති බවට වාර්තාවූවක් වේ. කෙසේ වෙතත් ඉන් පසුවද සිදුවූ අමාත්‍යාංශ සංශෝධනයත් සමඟ අදාල රථයේ අලාභ හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රමාද වී ඇත. 2019 පෙබරවාරි 07 දින එම රථය විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශයට භාර දී ඇති අතර එම අයාතනය දැනුවත් කර එම රථයේ සිදුවී ඇති අලාභයට අදාල තක්සේරු වාර්ථාවක් ලබාගෙන ඉදිරියේදී හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 වියදම් කළමනාකරණය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන වැය විෂයන් 02 ක් හා ප්‍රාග්ධන වැය විෂයන් 01 ක් සඳහා රු.2,900,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් සියයට 91 සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් ලෙස වාර්තා වී තිබුණි. | තාත්ත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කර අයවැය විචලනයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2018 මැයි මසදී ප්‍රාදේශීය සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ විෂය පථයට තිරසර සංවර්ධන හා වනජීවී විෂයද ඒකාබද්ධ වී තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන යනුවෙන් නව විෂය පථයක් සහිත අමාත්‍යාංශයක් ස්ථාපිත කෙරිණි. එහිදී තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය සඳහා 2018 වර්ෂයට වැය ශීර්ෂ අංක 161 යටතේ ප්‍රතිපාදන සැලසී තිබුණු අතර ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය සඳහා වැය ශීර්ෂ 147 යටතේ ප්‍රතිපාදන සැලසී තිබිණි. එම වැය ශීර්ෂ දෙකම ඉහත සඳහන් සංශෝධනයේදී එක් අමාත්‍යවරයෙක් යටතට පත්වීම හේතුවෙන් වියදම් දැරීමේදී 147 වැය ශීර්ෂයෙන් දැරීමට අපේක්ෂා කළ වියදම් 161 යටතේ දරා ඇත.<br>එමෙන්ම 2018 ඔක්තෝබර් මස 26 දින අනපේක්ෂිත ලෙස අමාත්‍යාංශ විෂයපථ සංශෝධනයත් සමඟ අපේක්ෂිත වියදම්ද ඉදිරිපත් නොවීය. මෙම හේතු නිසා විමසුමේ දක්වා ඇති පරිදි ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුවී ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී පුනරාවර්තන වැය විෂයයක හා ප්‍රාග්ධන වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබූ රු.650,000 ක මුළු ප්‍රතිපාදනය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | - එම - | - එම - |

**2.2 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක viii ට අනුව බැංකු ගිණුම් අංක 7041590 හි ශේෂය රු.71,729,655 ක් ලෙස දක්වා තිබුණද අමාත්‍යාංශයේ පොත් අනුව බැංකු ශේෂය රු.7,172,655 ක් වී තිබුණි. | අමාත්‍යාංශය සතුව පවතින ලේඛන නිවැරදිව පවත්නා ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බැංකු ප්‍රකාශය අනුව ශේෂය සටහන් කිරීමේදී අතපසුවීමකින් වැරදි සංඛ්‍යාවක් සටහන් වී ඇති බව පිළිගනිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්ය සාධනය වාර්තාව**

විගණනයට ඉදිරිපත් කළ වාර්ෂික කාර්යසාධන වාර්තාව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව මධ්‍යම හා නැගෙනහිර පළාත්වල විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන යටතේ රු.මිලියන 100 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, එම ප්‍රතිපාදනවලින් වැව් ප්‍රතිසංස්කරණය, පාලම් ඉදිකිරීම්, මාර්ග සංවර්ධනය, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යන ක්ෂේත්‍රවලට පමණක් සීමා වී තිබූ අතර කිසිදු විශේෂ සංවර්ධන ව්‍යාපෘතිය දියත් කර නොතිබුණි. | සීමිත සම්පතක් වන රජයේ ප්‍රතිපාදන ඵලදායී හා කාර්යක්ෂම ආයෝජන ප්‍රවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවිය යුතු වීම. | අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරයන් සැළකිල්ලට ගෙන ආයෝජන ප්‍රවර්ධනය සඳහා මූලිකව රු.මි.100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ආයෝජකයෙකු ආයෝජනයක් කිරීම සඳහා එකඟවූ විට ඔවුන් දිරිමත් කිරීම සඳහා යටිතල පහසුකම් සැපයීම අරමුණු කරගෙන මෙම ප්‍රතිපාදන වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට හැකි මට්ටම ආයෝජන අවස්ථා සඳහා එකඟතාවයන් ඇති නොවී තිබීම හේතුවෙන් ඒ සඳහා වෙන්කළ ප්‍රතිපාදන විධිමත්ව කළමනාකරණය කරගැනීම සඳහා වෙනත් සුදුසු ව්‍යාපෘතිවල එම ප්‍රතිපාදන යෙදවීමට කටයුතු කර ඇත.<br>මෙම අමාත්‍යාංශයේ සියවර ණය |

| | | |
|---|---|---|
| | | වැඩසටහන මඟින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් හා ව්‍යාපාරිකයන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීමට කටයුතු සිදුකර ඇත. දැනට ක්‍රියාත්මක වන Enterprise Sri Lanka වැඩසටහන හා සම්බන්ධව ඉහත වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. තවද, යටිතල පහසුකම් සංවර්ධන තුලින්ද කර්මාන්තකරුවන් සඳහා වක්‍රව පහසුකම් රාශියක් සපයා ඇත. |
| (ආ) ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්ක 03 ක් ආවරණය වන පරිද්දෙන් රු.25,999,285 ප්‍රතිපාදන නිදහස් කර තිබුණද එහිදී ක්‍රියාත්මක වූ ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය ශූන්‍ය අගයක් වී තිබුණි. | - එම - | අමාත්‍යාංශයට පාලනය කළ නොහැකි හේතුන් මත මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. රු.15,999,285 ක පිරිවැයකින් යුත් ව්‍යාපෘති 2 ක් අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.<br>ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.මි. 10 ක් වටිනා ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි බව දිස්ත්‍රික් ලේකම් වර්ෂ අවසානයේදී දන්වා ඇත.<br>ප්‍රාදේශීය සභාවේ එකඟතාවයක් නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකිව ඇත. |
| (ඇ) ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වූ මඩකළපුව අම්පුනායි වැවේ දෙවන අදියර වන සෝපාන දොරටුව හා සොරොව්ව ප්‍රතිසංස්කරණ ඉදිකිරීම් කටයුතු සඳහා මඩකළපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රු.මිලියන 15 ක් ප්‍රතිපාදන නිදහස් කර තිබුණද, ටෙන්ඩර් ප්‍රදානය කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් අතරමග නවතා දමා තිබුණි. | - එම - | මඩකළපුව දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කර ඇති පැහැදිලි කිරීම අනුව අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් අම්පුනායි වැවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට නොහැකි වූ බව දන්වා ඇත. |
| (ඈ) කුරුණෑගල හා ගම්පහ යන දිස්ත්‍රික්ක 02 ආවරණය වන පරිද්දෙන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පිළිවෙලින් රු. 999,285 ක් | - එම - | කුරුණෑගල මයාකඩවර අමුණ සංවර්ධනයේදී වර්ෂය අවසාන කාලපරිච්ඡේදයේ පැවති වාර්තාව සහිත අයහපත් කාලගුණික |

| | | |
|---|---|---|
| හා රු.5,000,000 ක් වූ ප්‍රතිපාදන කුරුණෑගල හා ගම්පහ යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී එම ප්‍රතිපාදන ආපසු අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. | | තත්වය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කිරීමේ වගකීම දිස්ත්‍රික් ලේකම් ගම්පහ වෙත පැවරී තිබූ අතර ඒ සඳහා ප්‍රතිපාදන ලබා දී තිබිණි. 2018 දෙසැම්බර් 05 දින ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි බව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා තිබුණි. ප්‍රමාණවත් කාලයක් නොමැති වීම හේතුවෙන් වෙනත් ව්‍යාපෘතිවලට මෙම මුදල් යෙදවීමට නොහැකි විය. මේ පිළිබඳව වැඩිදුරටත් සොයා බැලීමේදී ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රාදේශීය සභාවලින් නියමිත එකඟත්වයක් ලැබී නොතිබීම, හේතු වී ඇති බව හඳුනාගෙන තිබුණි. |
| (ඉ) පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මැදිරිගිරිය හුණු කඩය අසල පාලම ඉදිකිරීම සඳහා රු.2,894,542 ප්‍රතිපාදන නිදහස් කර තිබුණද එම ව්‍යාපෘතියද ක්‍රියාත්මක වී නොතිබුණි. | - එම - | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කර තිබූ නමුත් වර්ෂාව සහිත අයහපත් කාලගුණික තත්ත්වය නිසා ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වී ඇත. |

**3.2 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වෙනත් අමාත්‍යාංශ නමින් ලියාපදිංචි කර තිබූ වාහන 02 ක් විධිමත්ව පවරා ගැනීමකින් තොරව 2016 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගෙන තිබුණි. | වාහන විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අංක WP KJ- 3870 හා WP KR - 5664 දරන වාහන වෙනත් අමාත්‍යාංශ මඟින් මෙම අමාත්‍යාංශයට පවරා ගැනීමේ කටයුතු සිදු කර නොමැත. කෙසේ වෙතත් ඉහත වාහන දෙක මේ වන විට අමාත්‍යාංශයේ (ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනුරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ |

| | | |
|---|---|---|
| | | යෞවන කටයුතු අමාත්‍යාංශයේ) රාජකාරී සඳහා භාරදී ඇති බව කාරුණිකව සඳහන් කරමි. |
| (ආ) භාණ්ඩාගාරයේ අයවැය දෙපාර්තමේන්තුව මඟින් ලීසිං පදනම මත ලබා ගැනීමෙන් පසු අමාත්‍යාංශය වෙත පවරා ඇති වාහන 02 ක් හා රු.199,500 ක් වටිනා යතුරු පැදියක් ඇතුළු වාහන 03 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිශ්ක්‍රියව පැවතුණි. | නිෂ්කාර්යව පවතින රජයේ වාහන අරමුණු ගත කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වීම. | WP CAQ - 2498 දරන රථය පෙර සංචිතයේ පැවති රථයක් වන අතර තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය පැවති සමයේදී 2018 ජුනි 04 දින වන ජීවී භාරය වෙත තාවකාලිකව අනුයුක්ත කරන ලදී. එම රථය නැවත 2018 ජූලි 02 අමාත්‍යාංශ සංචිතයට භාරදෙන ලද අතර පසුව එම රථය සංචිත රාජකාරියේ යෙදවීම සඳහා ප්‍රමාණවත් රාජකාරී නොතිබූ බැවින් ධාවනයේ යෙදවීමක් සිදු කර නොමැත.<br>WP CAQ – 2528 දරන රථය ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු පරිහරණය කරන ලද රථයක් වන අතර 2018 ඔක්තෝබර් 26 දින අමාත්‍යාංශ සංශෝධනයක් සමඟ මෙම අංශයට ප්‍රමාණවත් රාජකාරී නොතිබුණු බැවින් එම රථය මෙතෙක් ධාවනයේ යොදවා නොමැත.<br>WP BFT -7735 දරන යතුරු පැදිය මෙම අමාත්‍යාංශය වෙත මිලදී ගනු ලැබුයේ තැපැල් රාජකාරී සඳහා යෙදවීමටය. සුදුසු නිලධාරියෙකු නොමැති වීම මත එම යතුරු පැදිය ධාවනයේ යොදවා නොමැත. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුලදී මසකට රු.162,500 බැගින් වූ මෙහෙයුම් කල්බදු වාරික යටතේ නව වාහන 02 ක් ලබා ගෙන තිබුණද එම වාහන භාවිතයට ගෙන නොතිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසානයේ සිට ඉදිරි මාස 03 ක කාලයක් සඳහා | නිෂ්කාර්යව පවතින රජයේ වාහන අරමුණු ගත කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වීම. | WP PI - 2358 දරන කැබ් රථය සංචිත රාජකාරී සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති රථයක් වන අතර පසුගිය අමාත්‍යාංශ සංශෝධනයත් සමඟ 2019 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සංවර්ධන ව්‍යාපෘති හෝ |

| | | |
|---|---|---|
| රු.814,708 ක වාරික ගෙවා තිබුණි. | | ප්‍රමාණවත් රාජකාරී නොතිබූ බැවින් එම රථය ධාවනයේ යොදවා නොමැත. මේ හේතුවෙන් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබාගත් පෞද්ගලික ආයතනය දැනුවත් කර කල්බදු ගිවිසුම අවලංගු කර මෙම වාහනය නැවත භාරගැනීමට කටයුතු කරන ලෙස දක්වා සිටි අතර ගිවිසුම ප්‍රකාරව වාහනය නැවත භාර දීමට මාස 03 කාලයක් ගත විය. ඒ අනුව 2019 මාර්තු 07 වන දින ගිවිසුම් අවලංගු කර මෙම රථය නැවත භාර දීමට කටයුතු කරන ලදී. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම.**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන්වලට අනුව ක්‍රියාත්මක වී ඇති බව වාර්තා කර තිබුණි. තිරසර සංවර්ධන අරමුණු ලෙස දරිද්‍රතාවය අවම කිරීම හා කුසගින්න තුරන් කිරීම යනාදිය හඳුනාගෙන තිබුණද, එම අරමුණු සහ ඉලක්ක කරා ලගා විය යුතු සන්ධිස්ථානයක් මෙන්ම, ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමේ කටයුතු අවසන්ව නොතිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්තිය සහ අදාල පනතට අනුකූලව කටයුතු කිරීමට ආයතනය විසින් කටයුතු කළ යුතු වීම. | අදාල දර්ශකයන් හඳුනාගැනීම පිළිබඳ තිරසර සංවර්ධන සභාව වෙතින් පිලිතුරු ලබා ගෙන ඉදිරියට කටයුතු කරන බව දන්වා සිටිමි. |